**කැලණිය ප්‍රාදේශීය සභාව**

**ගම්පහ දිස්ත්‍රික්කය**

1. **මූල්‍ය ප්‍රකාශන**

1.1 **මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2016 මාර්තු 29 දිනද ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන 2015 මාර්තු 31 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2016 ජූනි 29දින සභාවේ ලේකම්වරයා වෙත යවා ඇත.

1.2 තත්ත්වාගණනය කළ මතය

----------------------------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2015 දෙසැම්බර් 31 දිනට කැලණිය ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

1.3 **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**.

1.3.1 **ගිණුම්කරණ අඩුපාඩු**

පහත අඩුපාඩු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබියයුතු ආදායම් ආධාර රු.18,061,328 ක් ගිණුම්ගත කර තිබූ අතර ඒ තුළ 2014 කර්මාන්ත 12 ක් වෙනුවෙන් ලැබියයුතු රු.1,159,580 ක් ඇතුළත් කර තිබීම නිසා එම ප්‍රමාණයෙන් ලැබියයුතු ආදායම් ආධාර හා ආදායම් ආධාර ගිණුම වැඩියෙන් දැක්වුණි. එම වරද ජ'නල් සටහන් 04 මගින් ලැබියයුතු ආදායම් ආධාර ගිණුම හර කර සමුච්චිත අරමුදල බැර කිරීම හේතුවෙන් එම ගිණුම් දෙක රු.1,159,580 කින් වැඩියෙන් දැක්වුණි.

(ආ) වැඩිපුර ලැබී තිබූ ලැබියයුතු කර්මාන්ත ආධාර මුදල් රු.4,809,093 ක් ණයහිමි වෙන්කිරීම් නොකර සමුච්චිත අරමුදලට බැරකර තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ රු.1,413,007 ක් වූ ලිපිද්‍රව්‍ය පරිභෝජනය ජ'නල් සටහන් 65 මගින් රු.359,519 ක් ලෙස ගිණුම්ගත කිරීමේ වරද නව ජනල් සටහන් 5 මගින් නිවැරදි කිරීමේදී රු.359,519 ක් වැඩිපුර සටහන් කර තිබුණි.

1.3.2 **විගණනය සඳහා සාක්ෂි නොවීම**

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.48,430,866 ක්වූ ගනුදෙනු විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

2. **මූල්‍ය සමාලෝචනය**

2.1 **මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදමට වඩා වැඩි වූ ආදායම රු.76,820,822 ක් වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ ආදායමට වඩා වැඩි වූ පුනරාවර්තන වියදම රු.20,157,882ක් විය.

## 2.2 <u>ආදායම් පරිපාලනය</u>

### 2.2.1 <u>ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්</u>

ලේකම්වරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් විෂයය | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිගය |
|---|---|---|---|
| | රු. | රු. | රු. |
| වරිපනම් බදු | 99,179 | 35,561 | 40,606 |
| වෙළඳ බලපත්‍ර ගාස්තු | 2,022 | 1,665 | 357 |
| බදු කුලී | 17,781 | 11,991 | 5,789 |

### 2.2.2 <u>වරිපනම් බදු</u>

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය ආරම්භයේ පැවති රුපියල් මිලියන 35 ක්වූ හිඟ වරිපනම් බදු ශේෂය රු.මිලියන 40.6 දක්වා වැඩිවී තිබුණි.

(ආ) සභාවේ අවසන් වරට වරිපනම් බදු තක්සේරුවක් සිදුකර තිබුණේ 2009 වර්ෂයේදී වූ අතර, 2016 අප්‍රේල් 06 විගණිත දිනය වන විට වර්ෂ 7 ක් ඉක්මවා ඇතත් තක්සේරු ප්‍රතිශෝධනයක් කරවා ගැනීමට සභාව අපොහොසත් වී තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.40,606,002 ක් වූ හිග හිටි වරිපනම් ශේෂය තුළ වර්ෂ 1 ත් 3 ත් අතර කාලයක් හිග හිටි ශේෂය රු.23,208,569 ක්ද, වර්ෂ 5 ත් 10 අතර හිඟ හිටි ශේෂය ර.421,739 ක්ද ඇතුළත්ව තිබුණි. ඒ අනුව හිඟ හිටි ආදායම අයකර ගැනීමට සභාව විසින් විධිමත් පියවර ගෙන නොමැති බව නිරීක්ෂණය විය.

### 2.2.3 <u>බදුකුලී</u>

පහත කරුණු නිරික්ෂණය කරනු ලැබේ.

(අ) කැලණිය බස් නැවතුම්පොළ පිහිටි කඩ කාමර 24 ක් 2014 ජූලි 17 සිටම වසා දමා තිබූ අතර ඒවායින් සභාවට ආදායමක් ලබා ගැනීම කෙරෙහි අවධානය යොමුකර නොතිබුණි.

(ආ) 2015 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන අනුව රු.959,728 ක් වූ හිඟ මස්/මාළු කඩ කුලී ශේෂය තුළ වසර 5-10 ත් අතර කාලයක් පැරණි රු.78,496 ක ශේෂයක් පැවතුණි.

### 2.2.4 <u>බලපත්‍ර ගාස්තු</u>

2015 වර්ෂයට ලැබී ඇති සම්පූර්ණ වෙළඳ බලපත්‍ර සංඛ්‍යාව 1480 ක් වූ අතර නිකුත් කර ඇති වෙළඳ බලපත්‍ර සංඛ්‍යාව 885 ක් විය. සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලයට අත්සන් කර එවීමට භාරදී ඇති වෙළඳ බලපත්‍ර 480 ක් 2015 දෙසැම්බර් මස වනවිටත් නැවත සභාවට ලැබී නොතිබුණු අතර ඒ පිළිබඳව පසු විපරම් නොකිරීම නිසා ලබා ගත හැකි ආදායම් අහිමි වී තිබුණි.

3. **මෙහෙයුම් සමාලෝචනය**

3.1 **කළමනාකරණ අකාර්යක්ෂමතා**

2010 මැයි 26 දිනැති අංක 4/2010 විශ්‍රාම වැටුප් චක්‍රලේඛයේ 3 වැනි වගන්තිය ප්‍රකාරව තාවකාලික, කොන්ත්‍රාත්, දෛනික වැටුප් ලබන විශ්‍රාම වැටුප් අහිමි සේවකයන් සඳහා රාජ්‍ය සේවා අර්ථ සාධක අරමුදලට දායක මුදල් ගෙවිය යුතු වුවත් එකී නියමයන් පරිදි ක්‍රියා නොකිරීම හේතුවෙන් අදාළ සේවකයින් ගොනුකළ නඩුවේ තීන්දුව ප්‍රකාරව රු.209,673 ක දායක මුදල් හා අධිභාර මුදල් ගෙවීමට කම්කරු උසාවිය මගින් නියෝග කර තිබුණි.

3.2 **නිශ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්**

2010 වර්ෂයේ රු.මිලියන 1.8 කට ඉදිකර තිබූ බරණැස් කන්ද ප්‍රජා ශාලාව සුභ සාධන කාර්යය සඳහා යොදා නොගෙන වර්ෂ ගණනාවක සිට වසා දමා තිබුණි.

3.3 **සේවක ණය**

2015 දෙසැම්බර් 31 දිනට රු.19,488,619 ක් වූ සේවක ණය ශේෂය තුළ ස්ථාන මාරු හා සේවය හැර ගිය සේවකයින් 4 දෙනෙකුගෙන් අයවීමට ඇති ශේෂය රු.171,723 ක් වූ අතර එයින් රු.167,750 ක ණය ශේෂය වසර 5 ක් ද රු.3,973 ක් වූ ශේෂය වසර 10 ක් ද ඉක්මවා තිබුණි.

3.4 **මානව සම්පත් කළමනාකරණය**

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) ද්වීතියික ශ්‍රේණියේ පුරප්පාඩු 3 ක් පැවති අතර, තාක්ෂණ නිලධාරී තනතුර 2013 නොවැම්බර් 29 සිට පුරප්පාඩුව පැවතුණි.

(ආ) 2014 දෙසැම්බර් 29 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 25/2014(1) පරිදි ස්ථිර පත්වීම් ලැබූ වැඩ ක්ෂේත්‍ර පරිපාලක වරයෙක්ද, වැඩ/ ක්ෂේත්‍ර කම්කරුවන් 34 ක්ද, මුරකරුවන් 07 ක්ද, සෞඛ්‍ය කම්කරුවන් 17 ක්ද ලෙස 59 දෙනෙක් සේවයේ ස්ථිර කර ඇතත් අනුමත කාර්ය මණ්ඩලය සංශෝධනය කර ගැනීමට පියවර ගෙන නොතිබුණි.

(ඇ) 2015 වර්ෂය තුළ ප්‍රාථමික ශ්‍රේණිවල නිලධාරීන් 33 දෙනෙකු විසින් වැටුප් රහිත නිවාඩු දින 935½ ක් ලබා ගැනීම හේතුවෙන් සභාවේ දෛනික කාර්යයන් නිසි ලෙස ඉටුකර ගැනීමට බාධාවක්ව පැවතුණි.

3.5 **කොන්ත්‍රාත් පාලනය**

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) 2011 සැප්තැම්බර් 27 දිනැති රාජ්‍ය මුදල් අංක 452 දරන චක්‍රලේඛයේ 3.3 වගන්තිය ප්‍රකාරව කොන්ත්‍රාත්තුව පිරිනමන අවස්ථාවේ අදාළ ප්‍රජා පාදක සංවිධානය කොන්ත්‍රාත් තුනකට වැඩි කොන්ත්‍රාත් ප්‍රමාණයක නිරතවී නොසිටියයුතු බව දක්වා ඇතත්, ඊට පටහැනිව සීමා සහිත දළුගම විවිධ සේවා සමුපකාර සමිතිය වෙත 2015 පෙබරවාරි 11 දින ව්‍යාපෘති 23 ක් හා 2015 මාර්තු 16 දින ව්‍යාපෘති 26 ක් සඳහා ගිවිසුම් ගත වී ඇති අතර, දින 8 ක් 12 ක් වැනි කෙටි කාලයකින් වැඩ නිමවී තිබූ බව දක්නට ලැබුණි. මෙය කෙතරම් ප්‍රායෝගිකද යන්නත් නිම කරන ලද ව්‍යාපෘතිවල ගුණාත්මකභාවය පිළිබඳවත් විගණනයේදී මතභේදයට ලක්විය.

(ආ) ඉකුත් වර්ෂයේදී හා සමාලෝචිත වර්ෂය තුළදී රු.32,020,614 ක වියදමක් දරා හුණුපිටිය සහ වනවාසල ප්‍රදේශවල ආදාහනාගාර දෙකක් ඉදිකර තිබූ අතර, හුණුපිටිය ආදාහනාගාරය 2015 නොවැම්බර් 23 දිනද වනවාසල ආදාහනාගාරය 2015 ඔක්තෝබර් 29 දිනද වැඩ අවසන් කර ඇතත් 2016 අප්‍රේල් මාසය වන විටත් ජනතාවගේ අවශ්‍යතා සඳහා විවෘත කිරීමට කටයුතු කර නොතිබුණි.

3.6 **<u>ඝන අපද්‍රව්‍ය කළමනාකරණය</u>**

බල ප්‍රදේශය තුළ මාර්ග කිලෝ මීටර් 22 ක කසල අපහරණය කරනු ලබන අතර, ඒ සඳහා සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.16,911,107 ක වියදමක් දරා තිබුණි. මානෙල්ගම ප්‍රදේශයට කසල බැහැර කිරීමට අදාළව පරිසර අධිකාරියේ අනුමැතිය ලැබී ඇති බවට සාක්ෂි නොතිබුණි.

4. **<u>පද්ධති හා පාලන</u>**

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය
(ආ) අභ්‍යන්තර විගණනය
(ඇ) අයවැය පාලනය
(ඈ) ආදායම් පරිපාලනය
(ඉ) ගබඩා පාලනය